සියළුම හිමිකම් ඇවිරිණි]
All Rights Reserved ]

# පාසල් වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සඳහා පැවැත්වෙන විභාගය

II පත්‍රය

නැණ ලොවට පා නඟන හපනුන්ට මඟ කියන

## "අදිති"

4

පැය 01 යි මිනි 15

විභාග අංකය ..............................

**විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස්**

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 60 ක් ඇත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම ලියන්න.
- පිළිතුරු 3 ක් දී ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න පිළිතුරු ලියන්නට ඇති ප්‍රශ්නවල පිළිතුරු තිත් ඉර මත ලියන්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක**<br>ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බව සහතික කරමි. | V/I/S |
| **දෙවන පරීක්ෂක**<br>පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක**<br>ඇගයීම් කර ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | V/I/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක**<br>අධීක්ෂණය කළෙමි.<br>අවසාන ලකුණ නිවැරදිය. | V/I/S/CH |

01. පහත දැක්වෙන ඡේදය හොඳින් කියවන්න.

මිනිසාගේ එදිනෙදා කටයුතුවලට අවශ්‍ය වන්නේ ජලයයි. මේ වනවිට අප රටේ ජල සම්පත විනාශ වෙමින් පවතී. මෙහි අයහපත් ප්‍රතිඵල විඳීමට සිදුවන්නේ අනාගත පරපුරට යි. ජල සම්පත විනාශ වීමට හේතු වන්නේ මිනිසාගේ අයහපත් ක්‍රියා ය. ගස් කැපීම, කළු ගල් කැඩීම, වැලි ගොඩ දැමීම ඒ අතර ප්‍රධාන වෙයි. මෙවැනි අයහපත් ක්‍රියාමාර්ග වළක්වමින් ජලසම්පත රැක ගැනීමට දායකවන ලෙස <u>මධ්‍යම පරිසර අධිකාරිය මහජනතාවගෙන් සහය පතයි.</u>

- ප්‍රශ්නවලට පිළිතුරු ඡේදයෙන් ම තෝරා ගෙන තිත් ඉරි මත ලියන්න.

i. අප විසින් ආරක්ෂා කරගත යුත්තේ කුමක්ද? ..........................................................................

ii. ජල සම්පත විනාශ වීමට හේතුව කුමක් ද?..................................................................................

iii. ජල සම්පත විනාශ වීමෙන් එහි ප්‍රතිඵල විඳීමට සිදුවන්නේ කාට ද?.......................................

iv. මෙහි සඳහන් පරිසරය හා සම්බන්ධ බලය ලත් ආයතනය කුමක් ද?

..........................................................................

v. 'උදව්ව' යන වචනයට සමානාර්ථ පදයක් ඡේදයෙන් තෝරා ලියන්න. ..................................

vi. ඡේදයේ සඳහන් ඉරි ඇඳී වාක්‍ය අතීත කාලයට හරවා ලියන්න. ............................................

..................................................................................................................................................

02. පහත සඳහන් තේරවිලිවලට සුදුසු පද වරහන් තුළින් තෝරා හිස්තැන් සම්පූර්ණ කරන්න.

i. ඉනේ තිබෙන ලිය - ...............................................................

ii. අතු අග තිබෙන ලිය - ...............................................................

(අරලිය, පෙරළිය, හැඹිලිය, ඇතිළිය)

03. පහත වාක්‍යවල හිස්තැනට සුදුසු ක්‍රියා පදය වරහන තුළින් තෝරා යටින් ඉරක් අඳින්න

i. සඳ හා තරු අහසේ ............................. (දිලිසුණෝ ය. / දිලිසුණේ ය.)

ii. චාරිකාව යෑමට දෙමව්පියෝ අවසර .................................. (දෙති. / දෙයි)

iii. ඇය මිහිරි ගීතයක් .................... (ගැයුවා ය / ගැයුවේ ය.)

04. දී ඇති මාතෘකාවට ගැළපෙන පිළිතුර හිමි අංකය දී ඇති පිළිතුරු අතරින් තෝරා තිත් ඉර මත ලියන්න.

(1) ඉදිකටුවයි නූලයි වගේ (2) පනින්න පෙර සිතා බලනු (3) ඉහේ මලක් පිපුණා

i. ආප්තෝපදේශයකි ............ ii. ප්‍රස්තාව පිරුළකි ............. iii. ඉඟි වැකියකි .............

05. පහත සඳහන් වාක්‍ය බහු වචනයට හරවා ලියන්න.

මම කතන්දර පොත් කියවූවෙමි. - ..........................................................................................

06. පහත සඳහන් වාක්‍යයේ ඉරි ඇඳි වචනයෙහි යෙදී ඇති පිල්ලම්වල නාමය නිවැරදි ව තිත් ඉර මත ලියන්න.

<u>කෝසල</u> උදෙන් ම ගමට යයි. - ..............................................................................................

07. පහත සඳහන් ප්‍රකාශ නිවැරදිනම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද වරහන් තුළ යොදන්න.

i. 'තාරකා' අප්‍රාණවාචී ඒකවචන නාම පදයකි. ( )

ii. 'ඔවුහු' ප්‍රාණවාචී ඒකවචන නාම පදයකි. ( )

iii. 'ඈ' ස්ත්‍රී ලිංග ඒක වචන නාම පදයකි ( )

08. පහත කොටුව තුළ ඇති අකුරු ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු තිත් ඉරි මත ලියන්න.

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ඨ | ළ | ඡ | ඵ | ණ | ඵ | ෂ | උ | ඣ | ඝ |

i. මෙහි සඳහන් අවරෝණ අක්ෂර දෙකක් ලියන්න. ............................................

ii. මෙහි සඳහන් මූර්ධජ අක්ෂර දෙකක් ලියන්න. ............................................

iii. මෙහි සඳහන් මහාප්‍රාණ අක්ෂර තුනක් ලියන්න. ...........................................

09. ගැළපෙන විරාම ලකුණු යොදන්න

ඔයාලා එහෙම ද මුල් ගුරුතුමා විමසුවේ ය

10. පහත දැක්වෙන එක් එක් වාක්‍යයෙහි නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය වරහන තුළින් තෝරා යටින් ඉරක් අඳින්න

i. කමලා මීටර සියය දුර දිව්මේ (තරගයට/ තරඟයට) සහභාගි වූවා ය.

ii. තාත්තා (ඉණිමඟ/ ඉනිමඟ) දිගේ පහළට බැස්සේ ය.

11. පහත දෙමළ වාක්‍යය සිංහල තේරුම ලියන්න.

கங்கைலெ திரவுங்கள் - ..............................................................................................

12. පහත වාක්‍ය දෙමළෙන් කියවෙන ආකාරය සිංහල අකුරෙන් ලියන්න.

i. වෙලාව කීය ද? - ..............................................................................................


13. 1. පහත ඉංග්‍රීසී වචනවල සිංහල අර්ථය ලියන්න

i. peacock - ..............................................................................................

ii. How much is it? - ..............................................................................................

2. එක් එක් රූපයට ගැළපෙන නාමය ඉංග්‍රීසි අකුරෙන් ලියන්න.






i. ........................... ii. ...........................

- පහත ප්‍රශ්නවලට පිළිතුරු තිත් ඉර මත ලියන්න.

14. 12025 සංඛ්‍යාවේ සංඛ්‍යා නාමය ලියන්න - ...............................................................................

15. පහත සංඛ්‍යා විහිදුවා ලියන්න.

 1105 - ............................................................

16. දී ඇති සංඛ්‍යා අවරෝහණ පිළිවෙළට ලියන්න.

 10100 10101 10010 1015 - ...............................................................................

17. $10 \div 5 + 12$ ලැබෙන පිළිතුර රෝම සංඛ්‍යාවෙන් ලියන්න. - .......................................................

- භාෂා තුනකින් පුස්තකාලයක ඇති පොත් සංඛ්‍යාව පහත වගුවේ දැක්වේ. ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

| භාෂාව | සිංහල | ඉංග්‍රීසි | දෙමළ |
|---|---|---|---|
| පොත් ගණන | 4188 | 2018 | 875 |

18. භාෂා තුනේ ම පුස්තකාලයේ ඇති මුළු පොත් ගණන කීය ද? - ............................................


19. දෙමළ පොත්වලට වඩා ඉංග්‍රීසි පොත් කොපමණ ප්‍රමාණයක් වැඩියෙන් තිබේ ද?


 - ............................................................

20. ඇපල් ගෙඩි 56 කින් $\frac{1}{2}$ කට තවත් ඇපල් ගෙඩි 5ක් එකතු කළ විට පිළිතුර කීය ද?

 - ............................................................

21. පහත සඳහන් හැඩතලවල ඇඳිය හැකි උපරිම සමමිතික රේඛා අඳින්න.





22. කිරිබත් සෑදීම සඳහා සහල් $3kg$ $200g$ක් අවශ්‍ය විය. ඒ සඳහා නිවසේ ඇත්තේ සහල් $1kg$ $800g$ ක ප්‍රමාණයක් පමණි. කිරිබත් සෑදීමට තව කොපමණ සහල් ප්‍රමාණයක් අවශ්‍ය ද?

 - ............................................................

23. පහත ඔරලෝසු මුහුණතේ දැක්වෙන්නේ පස්වරු වේලාවකි. එම වේලාවට තවත් මිනිත්තු 45ක් එකතු කළවිට ලැබෙන වේලාව සම්මත ක්‍රමයට ලියන්න.




 - ............................................................


24. හිස්තැන් පුරවන්න.

| මිලිලීටර | ලීටර් හා මිලි ලීටර් |
|---|---|
| *1020l* | |
| | *12l 55ml* |

25.සංඛ්‍යා යෙදී ඇති රටාව බලා ඊ ළඟ හිස්තැන් දෙකට ගැළපෙන පිළිතුර ලියන්න.

2, 4, 8, 16, .................., .....................


26. පැන්සල් දෙකෙහි වෙනස කීය ද? - ..............................................................




27. නැගෙනහිර දිශාවට මුහුණ ලා සිටින සුජිත් ඇගේ දකුණු අත පැත්තට වට $\frac{1}{4}$ක් හැරුණුහොත් ඇය පිටුපා සිටින්නේ කුමන දිශාවට ද? - ..............................................................

28. බිත්තිර 727ක් එක් ඇසුරුමකට 8 බැගින් ඇසුරූ විට ඉතුරුවන බිත්තර ප්‍රමාණය කොපමණ ද? ....................................................

29. පාට නොකළ කොටස දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න.



.......................................................

- පහත සඳහන් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

30. සෞඛ්‍යවත් ජීවිතයක් සඳහා අවශ්‍යවන ශාරීරික හා මානසික යෝග්‍යතාව සපුරාලන ක්‍රියාකාරකම වනුයේ,
   1. සූර්ය නමස්කාරයයි.
   2. සිත් පහන් කිරීමයි.
   3. දිනපතා ශාරීරික ව්‍යායාම්වල යෙදීමයි.

31. නීරෝගි බීජයක් පැළවීමට සුදුසු ම තත්ත්වය වනුයේ,
   1. නටන තෙක් රත්කර නිවාගත් ජලයට දැමූ බීජ
   2. සමාන්‍ය කාමර උෂ්ණත්වයේ ජලයට දැමූ බීජ
   3. නටන තෙක් රත්කළ ජලයට පොත්තෙල් තට්ටුවක් දමා ඉන්පසු දැමූ බීජ

32. කොළ කැඳ සාදා ගැනීමට යොදාගන්නා ශාක පත්‍ර කාණ්ඩය වනුයේ,
   1. හාතාවාරිය, කරපිංචා, ගොටුකොළ
   2. ගොටුකොළ, කෙසෙල්, රම්පේ
   3. කොහිල, වැල්පෙනෙල, සේර

33. ශාකවලින් සතුන්ට සිදුවන යහපතක් වන්නේ,
   1. වාසස්ථාන සාදා ගැනීමට උදවු දීම
   2. ශාකවලට පොහොර ලබා දීම
   3. පස සංරක්ෂණයට දායක වීම


34. 2024.06.11  2024.07.11 මෙම දින සටහන් දෙක ආහාර ඇසුරුමක දක්නට ලැබුණි. පිළිවෙළින් මෙම දින දෙක විය හැක්කේ,
   1. විකිණීමට භාර දුන් දිනය, නිෂ්පාදිත දිනය
   2. නිෂ්පාදිත දිනය, කල් ඉකුත් වීමේ දිනය
   3. කල් ඉකුත් වීමේ දිනය, නිෂ්පාදිත දිනය

35. පරිභෝජනයෙන් පසු ඉතිරිවන ආහාර වියළා පසුව අපට රසවත් ආහාර ලෙස සකස් කළ හැකි ආහාර කාණ්ඩයක් වන්නේ,
   1. බත්, කඩල, මාළු, හාල්මැස්සන්
   2. පරිප්පු, සෝයා, ආප්ප, බත්
   3. බත්, පාන්, ඉදිආප්ප, මඤ්ඤොක්කා

36. රාජ්‍ය ලාංඡනය දැකිය නොහැකි ස්ථානයකි.
   1. අභ්‍යාස පොත් වල    2. පෙළ පොත්වල    3. රජයේ ලියකියවිලිවල

37. අපගේ දිවි පැවැත්මට සාර්ථක කර ගැනීමට ඉවහල්වන දෙයකි.
   1. සංකීර්ණ බව    2. සරල බව    3. වායු සමීකරණ කාමරවල

38. අප රටේ ඇති ලෝක උරුමයක් නොවන්නේ,
   1. සිංහරාජ වනාන්තරය    2. ගාලු කොටුව    3. මාතලේ අලුවිහාරය


39. 
   මෙම බලකොටුව නිර්මාණය කරන ලද රජතුමා වන්නේ,
   1. මුගලන් රජු
   2. කාශ්‍යප රජු
   3. දුටුගැමුණු රජු


40. විද්‍යුත් චුම්භකයක් සවිකර ඇති උපකරණයකි.
   1. විදුලි ස්ත්‍රික්කය    2. විදුලි සීනුව    3. ගිල්ලුම් තාපකය


41. පස් සාම්පලයක් බඳුනකට දමා ජලය දමා සොලවා නිශ්චල ව තැබූ විට බඳුනේ පතුලේ තැන්පත් වන්නේ,
   1. රොන් මඩ    2. වැලි    3. බොරළු ගල්

42. ආහාර හිඟ කාලවල දී නැවත ආහාරයට ගැනීමට කොස් ඇට කල් තබා ගන්නා ක්‍රමයකි.
   1. කැම්බීජ    2. ලුණු දැමීම    3. වැලියට දැමීම

43. පහත සඳහන් රූපවලින් රසවත් ව්‍යාංජනයක් සකස් කර ගැනීමට යොදාගන්නා මල් වර්ගය අයත් පිළිතුර තෝරන්න


1.


2.


3.

44. පෙරහැර අවසානයේ දිය කැපීමේ චාරිත්‍රය ඉටු කරන්නේ,

1. හින්දු ආගමේ ය. 2. බෞද්ධ ආගමේ ය. 3. ඉස්ලාම් ආගමේ ය.

45. දේශිය අනන්‍යතාවය පිළිබිඹු කරන කායික හා මානසික ශක්තිය වැඩියෙන් වැයවන සටන් ක්‍රමයකි,

1. මල්ලවපොර 2. කරාතේ 3. අංගම්පොර

46. නගර සභාවක හෝ ප්‍රාදේශීය සභාවක සතු කාර්යයක් නොවේ.

1. උපත් හා මරණ ලියා පදිංචි කිරීම
2. මහා මාර්ග නඩත්තු කිරීම
3. විදී ආලෝක ලාම්පු සවි කිරීම

47. ශ්‍රී ලංකාවේ ගොවිතැනෙහි පරිසර හිතකාමී නවතම ප්‍රවණතාවයක් වන්නේ,

1. රසායනික පොහොර භාවිතය
2. කාබනික පොහොර භාවිතය
3. විකල්ප වගා බඳුන් භාවිතය

48. ශක්තිජනක ආහාරයක් ලෙස සැලකෙන්නේ,

1. මාළු 2. සෝයා බෝංචි 3. දෙල්

49. බෝග වගාවට අහිතකර සත්ත්ව යුගලයකි,

1. ගැඩවිලා - මී මැස්සා 2. මයිටාවා - මී මැස්සා 3. කීඩෑවා -පිටිමකුණා

50. ඒක දේශික මත්ස්‍යයකු වන්නේ,

1. බුලත් හපයා 2. කැහි බෙල්ලා 3. වයිරි හාල් දණ්ඩා

51. පාසලේ සුන්දරත්වය වැඩි කිරීමට අප විසින් කළ යුතු දෙයකි,

1. පාසල අවට පරිසරය පිරිසිදු කර අලංකාර කිරීම
2. තැන තැන කසල බඳුන් සකස් කිරීම
3. පන්තියේ ඩෙස් පුටුවල තීන්ත ආලේප කිරීම.

52. අඩුවෙන් ජලය පානය කිරීමෙන් හානි විය හැකි ශරීර අවයවයකි.

1. ආමාශය 2. හෘද වස්තුව 3. වකුගඩු

53. අතීතයේ දී ගෙවතු වගාවේ ආරක්ෂාව සඳහා යොදාගත් සාම්ප්‍රාදායික ක්‍රමයක් නොවන්නේ,

1. කොහොඹ ඇට දියර භාවිතය
2. රසායනික පොහොර භාවිතය
3. වගාවන් සඳහා අළු යෙදීම

54. පෝෂ්‍යදායි ආහාර නොගැනීම නිසා ඇතිවන අපහසුතායක් නොවන්නේ,

1. කඩිසර ව වැඩ කිරීම.
2. නිසි පරිදි මුත්‍රා පිට නොවීම.
3. නිදිමත ඇති වීම.

55. ඔළිඳ කෙළිය සඳහා අවශ්‍ය නොවන දෙයකි,


1. ඔළිඳ පුවරුව  2. ක්‍රීඩා නීති රීති  3. බෙල්ලන්


56. මේ උපකරණ අතරින් කෘෂිකර්මාන්තයේ දී භාවිතවන කැරලි සහිත උපකරණය වන්නේ,

1. කියත  2. දැකැත්ත  3. දැති ගොයියා

57. පහත පින්තූර අතරින් ශ්‍රී ලංකාව තුළ අධ්‍යාපනය සඳහා විශාල මෙහෙවරක් කළ ශ්‍රේෂ්ඨ වූ පුද්ගලයා තෝරන්න.


1.


2.


3.

58. මෙයින් අප විසින් අනුගමනය නොකළ යුතු සෞඛ්‍ය පුරුද්දකි.

1. කෑමට පෙර සබන් යොදා අත් සේදීම
2. දිනකට දෙවරක් දත් මැදීම
3. වැසිකිළි යාමට පෙර සබන් යොදා අත් සේදීම

59. භාණ්ඩයක් පරිහරණයේ දී අප වැඩි වශයෙන් අවධානය යොමු කළ යුතු කරුණක් වන්නේ,

1. භාණ්ඩයේ නිමාව කෙරෙහි
2. භාණ්ඩය පරිහරණය කරන ආකාරය කෙරෙහි
3. භාණ්ඩයේ මිල කෙරෙහි.

60. දරුවෙකු යහමග යැවීමට කැපවෙන්නේ ගුරුවරයා ය. හොඳ නරක කියා දෙමින් දරුවාගේ දුකේ දී ත්, සැපේ දී ත් ළඟින් සිටිමින් සිප් සතර ඉගැන්වීම ගුරුවරයාගේ කාර්යභාරයයි. මෙම කරුණු සැලකිල්ලට ගනිමින් ''මම ගුරුවරයෙක් වෙමි'' මාතෘකාව යටතේ අර්ථවත් වාක්‍ය තුනක් ලියන්න. අක්ෂර වින්‍යාසය හා උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි විය යුතු අතර සෑම වැකියක ම අවම වශයෙන් වචන 5ක් වත් තිබිය යුතුය.

1. ..........................................................................................................................

..........................................................................................................................

2. ..........................................................................................................................

..........................................................................................................................

3. ..........................................................................................................................

..........................................................................................................................

(නිවැරදි, පැහැදිලි අත්අකුරු හා ඉලක්කම් සඳහා ලකුණු 02ක් ලබා දෙන්න.)